## ගෙවුම් තුලන ලේඛනය

ගෙවමු් තුලන ලේඛනය/ ගෙවුම් ශේෂ ලේඛනය යනු වර්ෂයක කාල පරිච්ඡේදයක් තුළ රටක් විසින් සෙසු ලෝකය සමඟ කරන ලද ආර්ථික ගනුදෙනු හේතුවෙන් වෙනත් රටවලින් ලැබෙන විදේශ මුදල් හා විදේශ රටවලට ගෙවන විදේශ මුදල් හා ඒවා අතර වෙනස තුලනය කරන ආකාරය දක්වන ලේඛනයකි.

මෙමගින් කිසියම් රටක් නේවාසිකයන් හා අනේවාසිකයන් අතර සිදු වන සියලු ආර්ථික ගනුදෙනු ක්‍රමානුකූල ව ද්විත්ව ගිණුම්කරණ මූලධර්මය මත සටහන් කෙරේ.

ගෙවුම් තලුන ලේඛනයක ඇතළුත් කරන ගනුදෙනුවාර්තා කිරිමේ දීඅනුගමනය කරන මලූික සම්මතය වනුයේ සෑම ගනුදෙනුවක් ම එක හා සමාන වටිනාකමින් දෙතැනක සටහන් කළ යුතු වීම යි.

මෙම ගනුදෙනු සටහන් කිරීමේ දී සෑම ගනුදෙනුවකට ම වටිනාකම හර අගයක් සහ බැර අගයක් වශයෙන් තීරු දෙකක සටහන් කළ යුතු අතර බැර වටිනාකම + ලකුණින් සහ හර වටිනාකම (-) ලකුණින් සටහන් කළ යුතු වේ.

මෙලෙස ගෙවුම් තුලන ලේඛනයේ ඇතුළත් සියලු ම ගනුදෙනු සමාන අගයකනිි බැර තරීුවක සහ හර තරීුවක සටහන් කළ විට සියලු ගනුදෙනුවල ශුදධ් ශේෂය ශනූ්‍ය අගයක් ගනී "ගෙවුම් තුලන ලේඛනය සෑම විට ම තලුනය වේ" යනුවෙන් අදහස් වන්නේ මෙය යි.

ගෙවුම් තුලන ලේඛනයේ "හර" සහ "බැර" අගයන් වෙන් වෙන් ව සටහන් කිරිමේ දී මූලධර්ම දෙකක් අනුගමනය කළ යුතු ය.

 භාණ්ඩයක් / සේවාවක් / වත්කමක් තම රටෙන් වෙනත් රටකට බැහැර වන විට එම අයිතමයේ වටිනාකම බැර වටිනාකමක් + ලෙස සටහන් කළ යුතු වේ.

නිදසුන් : ශ්‍රී ලංකාවේ ඇගලුම් අපනයන කළ විට එම වටිනාකම ජංගම ගිණුමේ බැර සටහනක් ලෙස ඇතුළත් කළ යුතු වේ.

භාණ්ඩයක් / සේවාවක් / වත්කමක් තම රටට වෙනත් රටකින් ලැබෙන විට එම අයිතමයේ වටිනාකම හර වටිනාකමක් (-) ලෙස සටහන් කළ යුතු වේ.

නිදසුන් :ශ්‍රී ලංකාවට මැද පෙරදිග රටකින් ඛනිජ තෙල් ආනයන කළ විට එම වටිනාකම ජංගම ගිණුමේ හර සටහනක් ලෙස ඇතුළත් කළ යුතු වේ.

## නව ආකෘතයිට අනුව ගෙවුම් තලුන ලේඛනයේ ඇතුළත් ගනුදෙනු

- ❖ භාණ්ඩ සහ සේවා අපනයනය කිරිම සහ ආනයනය කිරිමට අදාළ ගනුදෙනු
- ❖ ආදායම් ලැබීම හා ගෙවීම ආශ්‍රිත ගනුදෙනු
- ❖ වත්කම්, ධනය, ත්‍යාග වැනි දෑ පිළිබඳ ව ඒක පාර්ශ්වීය ව සිදු කරන ගනුදෙනු
- ❖ නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් හිමි කර ගැනීම හා විකිණීම ආශ්‍රීත ගනුදෙනු
- ❖ මූල්‍ය වත්කම් හිමි කර ගැනීම හා විකිණීම ආශ්‍රිත ගනුදෙනු

එම ගනුදෙනුවල ස්වභාවයන් අනුව ගෙවුම් තුලන ලේඛනයේ නව ආකෘතියට අනුව ප්‍රධාන ගිණුම් 3 කි.

- ❖ ජංගම ගිණුම
- ❖ ප්‍රාග්ධන ගිණුම
- ❖ මූල්‍ය ගිණුම

 ජංගම ගිණුම නැවත කොටස් තුනකි. එනම්,

1. භාණ්ඩ හා සේවා ගිණුම

    1.1 භාණ්ඩ ගිණුම

    1.2 සේවා ගිණුම

2. ප්‍රාථමික ආදායම් ගිණුම

3. ද්විතීයක ආදායම් ගිණුම

## 1. භාණ්ඩ හා සේවා ගිණුම

<u>**භාණ්ඩ ගිණුම**</u>

ලෝකයේ එක් රටක් සෙසු රටවල් සමඟ සිදු කරන භාණ්ඩ අපනයන හා ආනයනය පිළිබඳ ව සටහන් කරන ගිණුම භාණ්ඩ ගිණුම හෙවත් වෙළෙඳ ගිණුම ලෙස හැඳින්වේ.

මෙම වෙළෙඳ ගිණුමේ මූල්‍ය නොවන රත්රන් පෞද්ගලික අංශයේ වටිනාකම් සන්නිධියක් ලෙස සටහන් වේ. මෙම වෙළෙඳ ගිණුමේ ශේෂය වෙළෙඳ ශේෂය ලෙස හඳුන්වයි. දෘශ්‍ය භාණ්ඩ ගිණුමේ ශේෂය ලෙස ද එය හඳුන්වයි.

ශ්‍රී ලංකාවේ විදේශ වෙළෙඳාම සම්බන්ධ ගනුදෙනු කිහිපයක නිදසුන් පහත දැක්වේ.

1. ශ්‍රී ලංකාවේ ඇඟලුම් සමාගමක් මිලියන 500ක් වටිනා ඇඟලුම් තොගයක් අපනයනය කිරීම

2. ජපානයේ මෝටර් රථ සමාගමකින් මිලියන 1000ක් වටිනා මෝටර් රථ අපනයනය කිරීම

මෙම නිදසුන සම්බන්ධ ගනුදෙනුව භාණ්ඩ ගිණුමට ඇතුළත් වේ.

වෙළෙඳ ශේෂය     භාණ්ඩ අපනයනය - භාණ්ඩ ආනයනය

නිදසුන :     -ඇඟලුම් අපනයනය - මෝටර් රථ ආනයනය

- 500 - 1000
- <u>- 500</u>

වෙළෙඳ ගිණුමේ ශේෂය අතිරික්තයක් හෝ + හිඟයක් හෝ (-) විය හැකි ය. ඉහත නිදසුන අනුව වෙළෙඳ ගිණුමේ ශේෂය ඍණ අගයකි.

<u>**සේවා ගිණුම**</u>

අන්තර් ජාතික වෙළෙඳාමේ දී රටක් අනෙකුත් රටවල් සමඟ සාධක නොවන සේවා සඳහා කරනු ලබන වියදම් සහ ලැබෙන ආදායම් සටහන් කරන ගිණුම සේවා ගිණුමේ වේ.

සේවා ගිණුමට පහත සඳහන් සංරචක අයත් වේ.

- ❖ සංචාරක සේවා
- ❖ මුහුදු ප්‍රවාහණ
- ❖ ගුවන් ප්‍රවාහණ
- ❖ මූල්‍ය සේවා
- ❖ විදුලි සන්දේශ සේවා  රක්ෂණ සේවා

| |
|---|
| සේවා ගිණුමේ ශේෂය - සේවා අපනයන ආදායම - සේවා ආනයන වියදම |

සේවා ගිණුමේ ශේෂය අතිරික්තයක් + හෝ හිගයක් (-) විය හැකි ය. භාණ්ඩ ගිණුමේ ශේෂය සේවා ගිණුමේ ශේෂය ගැලපීමෙන් භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය ලැබේ.

| |
|---|
| භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය = භාණ්ඩ ගිණුමේ ශේෂය + සේවා ගිණුමේ ශේෂය |

**ප්‍රාථමික ආදායම ගිණුම**

නේවාසිකයින්ට නිශ්පාදන ක්‍රියාවලිය සඳහා ඔවුන්ගේ දායකත්වය වෙනුවෙන් හෝ මූල්‍ය හා ස්වභාවික වත්කම් අනේවාසිකයින්ට සැපයීම වෙනුවෙන් කරනු ලබන ගනුදෙනු ප්‍රාථමික ආදායම් යටතට ගැනේ.

ප්‍රාථමික ආදායම ගිණුමට ඇතුළත් වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රයෙන් පැන නගින පොළී, වැටුප් හා මූල්‍ය වත්කම් ආයෝජනයෙන් උපයා ගන්නා ලාභාංශ ආදිය යි.

ශ්‍රී ලංකාවේ විදේශ ගනුදෙනු සම්බන්ධ නිදසුන් කිහිපයක් පහත දැක්වේ.

1. ශ්‍රී ලංකාවේ විදේශයී රටවලින් ලබා ගත් ණය සඳහා වාර්ෂික පොළිය මිලියන 500ක් ගෙවීම

2. ශ්‍රී ලාංකික සමාගමක් මාලදිවයිනේ ඇගලුම් කම්හලක ආයෝජනයෙන් මිලියන 300ක් ලාභාංශ ලැබීම

මෙම නිදසුන් සම්බන්ධ ගනුදෙනු ගෙවුම් තුලන ලේඛනයේ ප්‍රාථමික ආදායම් ගිණුමට ඇතුළත් වේ.

ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය = විදේශ සාධක ලැබීම් - විදේශ සාධක ගෙවීම්

විදේශ සාධක ලැබීම් 300 - විදේශ සාධක ගෙවීම් 500

= - 200 (ඩොලර් මිලියන)

**ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය**

ශ්‍රී ලංකාවේ නෙවාසකියන් සහ අනෙවාසකියන් අතර සිදු වන ගනුදෙනු කිහිපියක් පහත දැක්වේ.

මැදපෙරදිග සෙව්ය කරන ලාංකකියන් තම ඥාතනීට් මිලයින 1500ක පෙශ්‍රණ වශයෙන් වාණිජ බැංකුව වෙත එවීම

ශ්‍රී ලංකාවේ චීන ජාතිකයන් තම ඥාතීන් වෙත මිලියන 500ක ප්‍රේශණ චීනයේ බැංකුවක් වෙත යැවීම

නිදසුන : ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය = විදේශ සංක්‍රාම ලැබීම් - විදේශ සංක්‍රාම ගෙවීම

= විදේශ සංක්‍රාම ලැබීම් 1500 - විදේශ සංක්‍රාම ගෙවීම් 500

= 1000 (ඩොලර් මිලියන)

ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුමට ඇතුළත්

- භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය
- ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය

 ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය ගැලපීමෙන් ජංගම ගිණුමේ ශේෂය ලැබේ.

| | බැර + | හර - | ශේෂය |
|---|---|---|---|
| භාණ්ඩ හා සේවා ගිණුමේ ශේෂය | 500 | 1000 | - 500 |
| ප්‍රාථමික ආදායම් ගිණුමේ ශේෂය | 300 | 500 | - 200 |
| ද්විතීයක ආදායම් ගිණුමේ ශේෂය | 1500 | 500 | 1000 |
| ජංගම ගිණුමේ ශේෂය | | | 300 |

## ප්‍රාග්ධන ගිණුම

මූල්‍ය වත්කම් මූල්‍ය ගිණුම තුළ ඇතුළත් වන අතර නිෂ්පාදනය නොකළ මූල්‍ය නොවන වත්කම් ප්‍රාග්ධන ගිණුමේ සටහන් කරනු ලැබේ. නිෂ්පාදනය නොකළ මල්‍ය නොවන වත්කම් නෙවාසිකයන් සහ අනේවාසිකයන් අතර සිදු වන ගනුදෙනු ප්‍රාග්ධන ගිණුමේ හර - බැර ලෙස සටහන් වේ.

නිෂ්පාදනය නොකළ මූල්‍ය වත්කම් කිහිපයක් පහත දැක්වේ.

 බලපත්‍ර

 බදු ගිවිසුම්

 සන්නම්

 කීර්ති නාමය විකිණීම / මිල දී ගැනීම

 තානාපති කාර්යාලයයකට ඉඩම් විකිණීම

 ජාත්‍යන්තර ආයතන / රජයෙන් ලබා දෙන ප්‍රදාන

 පේටන්ට් බලපත්‍ර (ස්වාධිකාරී අයිතිය)

 පුරස්කාර

## <u>මූල්‍ය ගිණුම</u>

ගෙවුම් තුලන ලේඛනයේ අවසාන උප ගිණුම මූල්‍ය ගිණුමයි. නේවාසිකයින් සහ අනේවාසිකයින් අතර සිදු වන මූල්‍ය වත්කම් හා වගකීම් ආශ්‍රිත ගනුදෙනු මූල්‍ය ගිණුමෙහි වාර්තා කෙරේ.

කාර්යාත්මක ස්වරූපය මත මූල්‍ය ගිණුමේ ගනුදෙනු ප්‍රධාන වශයෙන් කොටස් පහකට බෙදිය හැකි ය.

එනම්,

- සෘජු ආයෝජන
- කලඹ ආයෝජන
- මූල්‍ය ව්‍යුත්පන්න
- වෙනත් ආයෝජන
- විදේශ සංචිත වත්කම්

කිසියම් රටක ගෙවුම් තුලන ලේඛනයේ ජංගම ගිණුම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව එම රට අවශේෂ ලෝකය සමඟ ශුද්ධ ණය හිමියෙක් ද (ගෙවුම් තුලන අතිරික්තයක්) නැතහොත් ශුද්ධ ණය ගැතියෙක් ද ( ගෙවුම් තුලන හිඟයක් ද යන්න පෙන්නුම් කරයි.

ද්විත්ව ගිණුම් මූලධර්මයට අනුව ජංගම සහ ප්‍රාග්ධන ගිණුමේ ශේෂවල එකතුව මූල්‍ය ගිණුමේ ශෙෂ්යට සමාන විය යුතු අතර කිසයිම් සංඛ්‍යානමය වරදක් නිසා අසමානතාවක් හටගතහොත් "**ශුද්ධ වැරදීම් හා අත්හැරීම්** යන අයිතමය යොදා ගනිමින් එම සමානත්වය ඇති කෙරේ.

මූල්‍ය ගිණුම මඟින් පෙන්නා දෙන්නේ රටක ශුද්ධ ණයහිමි බව හෝ ශුද්ධ ණය ගැතිබව මූල්‍යනකරණය කෙරෙන ආකාරයයි.

පැවරුම 2019 A/L

## 08 වන ප්‍රශ්නය

8. (i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන අපනයන සහ ආනයන අයිතමයන් **හතර** බැගින් නම් කරන්න. (ලකුණු 04යි)

(ii) 'තරඟකාරිත්ව වාසිය' (competitive advantage) යනු කවරක් ද? තරඟකාරිත්ව වාසි බිහි කරන මූලාශ්‍ර කවරේ ද? (ලකුණු 04යි)

(iii) කිසියම් කල්පිත ආර්ථිකයක ගෙවුම් ශේෂ ගනුදෙනුවල සාරාංශයක් පහත වගුවෙන් ඉදිරිපත් කෙරේ. (සියලු ම සංඛ්‍යා රුපියල් බිලියනවලිනි.)

| අයිතමය | වටිනාකම | අයිතමය | වටිනාකම |
|---|---|---|---|
| භාණ්ඩ අපනයන | 1 500 | රජයේ ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) | 120 |
| භාණ්ඩ ආනයන | 1 300 | පෞද්ගලික ප්‍රාග්ධන සංක්‍රාම (ශුද්ධ) | 80 |
| සේවා අපනයන | 500 | ශුද්ධ සෘජු ආයෝජන | 350 |
| සේවා ආනයන | 400 | ශුද්ධ කලඹ ආයෝජන | 150 |
| ආයෝජන ආදායම් ලැබීම් | 800 | ශුද්ධ වෙනත් ආයෝජන | 120 |
| ආයෝජන ආදායම් ගෙවීම් | 600 | සංචිත වත්කම් | 160 |
| ශුද්ධ වර්තන සංක්‍රාම | 100 | වැරදීම් සහ අත්හැරීම් | 20 |

ඉහත දත්ත යොදා ගනිමින් පහත දෑ ගණනය කරන්න.

(a) වෙළෙඳ ශේෂය (ලකුණු 02යි)

(b) ජංගම ගිණුමේ ශේෂය (ලකුණු 02යි)

(c) මූල්‍ය ගිණුමේ ශේෂය (ලකුණු 02යි)

(d) ශුද්ධ අපනයන (ලකුණු 02යි)